# ටෙන්ඩර් කැඳවීම - 2025 වර්ෂය
# තංගල්ල නගර සභාව

තංගල්ල නගර සභාවට අයත් පහත උපලේඛනයේ දැක්වෙන බදු විෂයන්ට අදාළව 2025.01.01 සිට 2025.12.31 දක්වා ලිත් වර්ෂය සඳහා දේපල බදු දීම / බදු එකතු කිරීමේ අයිතිය ලබාදීම සඳහා පහත කොන්දේසි යටතේ ටෙන්ඩර් කැඳවනු ලැබේ.

**කොන්දේසි :**

01. අයදුම්කරු වයස අවු: 18 ඉක්මවූ ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතු අතර, පදිංචිය සනාථ කිරීම සඳහා ග්‍රාම නිලධාරි සහතිකය, ජාතික හැඳුනුම්පත, වාර්ෂිකව රු. 240,000.00 ට වැඩි ආදායමක් පවතින බවට ප්‍රාදේශීය ලේකම් විසින් නිකුත් කරන ආදායම් සහතිකය ඉදිරිපත් කර, අදාළ ටෙන්ඩර් පෝරම ගාස්තුව (ආපසු නොගෙවන) හා ටෙන්ඩර් ඇප තැන්පත් මුදල (ආපසු ගෙවන) ගෙවා 2024.10.11 දින පෙ.ව. 08.00 සිට 2024.11.04 දින ප.ව 03.00 දක්වා තංගල්ල නගර සභා කාර්යාලයෙන් ටෙන්ඩර් පෝරමය ලබාගත හැක.
02. නිසි ලෙස සම්පූර්ණ කරන ලද ටෙන්ඩර් අයදුම්පත්‍ර පිටපත් දෙකකින් සකස් කර මුල් පිටපත හා අනු පිටපත ලෙස වෙන වෙනම කවරවල බහා, එම කවර දෙකම එක් කවරයක බහා එම කවරයේ වම්පස ඉහළ කෙළවරේ අදාළ බදු විෂය සඳහන් කර 2024.11.05 දින පෙ.ව. 10.00 ට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් හෝ ගෙනවිත් භාරදීමෙන් හෝ තංගල්ල නගර සභා කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලීමෙන් හෝ භාරදිය හැකිය.
03. අපගේ වෙබ් අඩවියෙන් අයදුම්පත්‍රය බාගත කරගන්නේ නම්, උපලේඛනයේ සඳහන් ලංසු රක්ෂණ මුදල (ආපසු ගෙවන) හා ටෙන්ඩර් පෝරම ගාස්තුව යන දෙකෙහි වටිනාකම **මහජන බැංකුවේ අංක 067100175533192** දරණ **"ලේකම්, තංගල්ල නගර සභාව"** යන ගිණුමට බැර කර අදාළ බැංකු රිසිට් පත්‍රයේ ඡායා පිටපතක් සමඟ අයදුම්පත්‍රය ඉදිරිපත් කළ හැකිය.
04. 2024.11.05 දින පෙ.ව. 10.30 ට ටෙන්ඩර් පත්‍ර විවෘත කිරීම සිදුකරනු ලබන අතර, ඒ සඳහා ටෙන්ඩර් අයදුම්කරුට හෝ බලයලත් නියෝජිතයකුට එම අවස්ථාවට සහභාගී වීමට අවසර දෙනු ලැබේ.
05. සුදුසුකම්ලත් ටෙන්ඩර් අයදුම්කරුවෙකුට අදාළ ටෙන්ඩරය ප්‍රදානය කිරීම හෝ යම් පිළිගත හැකි කාරණයක් හෝ කාරණා කිහිපයක් නිසා ටෙන්ඩරය ප්‍රතික්ෂේප කිරීම හෝ අවලංගු කිරීමේ බලය ටෙන්ඩර් මණ්ඩලය සතුවේ.
06. මේ සම්බන්ධව වැඩිදුර විස්තර **047-2240275** දුරකතන අංකයට ඇමතීමෙන් හෝ www.tangalle.uc.gov.lk වෙබ් අඩවියට පිවිසීමෙන් ලබාගත හැක.

**උපලේඛනය**

| අ.අ | කාරණය | ඉල්ලුම් කළ හැකි අවම ලංසු වටනාකම රු . ශත | ටෙන්ඩර් ඇප මුදල (ලංසු සුරක්ෂණ) (ආපසු ගෙවන) රු. ශත | ටෙන්ඩර් පෝරම ගාස්තුව (ආපසු නොගෙවන) රු. ශත |
|---|---|---|---|---|
| 01 | තංගල්ල ජනතා පොළ, මාලු වෙළඳපොළ බදු අයකිරීම සහ නගර සභා සීමාව තුළ අමතර බදු එකතු කිරීමේ අයිතිය බදු දීම. | 5,500,100.00 | 100,000.00 | 1,500.00 |
| 02 | තංගල්ල පොදු වෙළඳපොළ ගව මස් කඩය බදු දිම. | 668,000.00 | 50,000.00 | 500.00 |
| 03 | නව පොදු වැසිකිළියෙහි බදු අයකිරීමේ අයිතිය ලබාදීම. | 1,120,000.00 | 50,000.00 | 500.00 |
| 04 | පරෙයිවැල්ල වෙරළ උද්‍යානයේ ගාස්තු අය කිරීමේ අයිතිය බදු දීම. | 2,685,000.00 | 50,000.00 | 1,500.00 |
| 05. | තංගල්ල තේක්කවත්ත උඩපාර ආරම්භ වන ස්ථානයේ ඇති හිස් භූමි අවකාශය අලංකාර කිරීම හා දැන්වීම් පුවරු ප්‍රදර්ශනය කිරීමේ අයිතිය ලබාදීම. | 52,000.00 | 5,000.00 | 1,000.00 |

ටී.ඩබ්.කේ. රූපසේන
ලේකම්
තංගල්ල නගර සභාව
2024.10.11